# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,519- 2007 ඔක්තෝබර් 12 වැනි සිකුරාදා - 2007.10.12

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 938 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 939 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 939 |
| මිළ පාලන දැන්වීම් | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 939 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |


සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සැහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 ඔක්තෝබර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 ඔක්තෝබර් මස 05 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 418

ඩී/22/එන්වයි/40.

## ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

පහත නම සඳහන් නිලධාරිණිය 2007 ජුලි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායෙන් විශ්‍රාම ගැන්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කොමාණ්ඩර් (සැ) රාජපක්ෂ මුදියන්සේලාගේ නන්දා රාජපක්ෂ, ශ්‍රීලංනාහ, එන්ආර්එස් 0416

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

10-445/1

2007 අංක 419

ඩී/22/එන්වයි/401.

## ශ්‍රී ලංකා නාවික හමුදාව

### නිත්‍ය නාවික උප සේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරිණිය 2007 ජුලි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදාවේ ස්ථිර බලකායේ සිට නිත්‍ය නාවික උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා අනුමත කර ඇත :

කොමාණ්ඩර් (සැ) රාජපක්ෂ මුදියන්සේලාගේ නන්දා රාජපක්ෂ, ශ්‍රීලංනාහ, එන්ආර්එස් 0416

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

10-445/2

---

2007 අංක 420

DIVF/RECT/53/AY.

## ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බල සේනාව

### අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම් හා ඇතුළත් කිරීම්

පහත නම සඳහන් කෙඩෙට් නිලධාරී 2006 සැප්තැම්බර් මස 04 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ දෙවන ලුතිනන් නිලයෙන් අධිකාරියට පත් කිරීම හා එදිනම සිට ඉංජිනේරු සේවා බලකාය වෙත ඇතුළත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කෙඩෙට් නිලධාරී රඹුක්කනගේ දර්ශන රාජපක්ෂ (සී/31817)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය සහ සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

10-444

# වෙනත් පත්කිරීම් ආදිය

## නොතාරිස් ආඥාපනත 107 වන අධිකාරය

ගාල්ල, මහාධිකරණ කලාපය තුළ සිංහල භාෂාවෙන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට බලය ලත් කලුපහන ලියනගේ පියදාස ඩයස් මහතා 2006.03.01 දින සිට නොතාරිස් ධූරයෙන් ඉල්ලා අස්වීමේ ලියවිලි ඉදිරිපත් කරන ලදුව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් එකී දින සිට එම ඉල්ලා අස්වීම භාරගෙන තිබේ.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 08 වැනි දින,
කොළඹ 07 දී ය.

10-351

# ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය : ඊඩී/1/28/2/1/24.
නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන
ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.
2007 සැප්තැම්බර් මස 04 වැනි දින.

## උපකෘත (ඉංග්‍රීසි) පාසැල් ව්‍යවස්ථා මාලාව යටතේ අන්ධ, බිහිරි හා මන්ද මානසික ළමයින් සඳහා වන උපකෘත පාසලක නව කළමණාකරුවෙකු පත් කිරීම පිළිබඳ නිවේදනය

උපකෘත පාසැල් ව්‍යවස්ථාවෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව 2005.03.24 දින සිට සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, බලංගොඩ මැතිවරණ කොට්ඨාශයේ, බලංගොඩ පිහිටි අන්ධ සහ බිහිරි ළමයින් සඳහා වන යශෝදරා උපකෘත විශේෂ පාසැලෙහි නව පාසැල් කළමනාකරු වශයෙන් කරුණාධිපති වාසල විජේකෝන් මුදියන්සේලාගේ නන්දන තිහාල් විජේකෝන් මහතා පත් කර ඇති බව මහජනතාවගේ දැන ගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ.

ආරියරත්න හේවගේ,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2007 සැප්තැම්බර් මස 04 වැනි දින,
නොවිධිමත් හා විශේෂ අධ්‍යාපන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
'ඉසුරුපාය',
බත්තරමුල්ල.

10-350

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - මහනුවර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරණ මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.06.22 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුව සඳහා මහනුවර ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. කේ. විජේරත්න විසින් සහතික කරන ලද අංක 4677 හා 2005.04.07 දින දරන උකස්කරය මත මහජන බැංකුවට ලැබිය යුතු හා අයවිය යුතු රුපියල් එක් ලක්ෂ හැත්තෑ නවදහස් එකසිය හැට හයකුත් ශත හැට එකක (රු. 179,166.61) මුදල එකී උකස්කරය ප්‍රකාර ගෙවීම අතුරුගිරිය ආරච්චිගේ දයාන් ජානක අතුරුගිරිය මහතා සහ ගොඩවෙල විදානලාගේ ගෙදර චන්දිමා වීරකෝන් මහත්මිය යන අය විසින් පැහැර හැර ඇති බැවින්ද 2006.12.29 දින සිට වර්ෂයකට 18.25% (දහඅටයි දශම දෙකයි පහ) බැගින් රුපියල් එක්ලක්ෂ හැත්තෑ නවදහස් එකසිය හැටහයකුත්

ශත හැට එක (රු. 179,166.61) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ '29එල්' වගන්තිය යටතේ අයකරගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තුද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑ නවදහස් එකසිය හැටහයකුත් ශත හැට එකක (රු. 179,166.61) මුදල අයකරගැනීම සඳහා මහනුවර බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් එකී අංක 4677 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස් කර ඇති දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, යටිනුවර මැද පළාතේ යටිනුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ පිළිමතලාවේ පිහිටි මදුරාවේ උඩහවලව්වේවත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එච්. එම්. ආර්. ටී. කේ. හේරත් විසින් මැන සාදන ලද අංක 2817 හා 2004.06.04 දින දරන පිඹුරේ කැබලි අංක 1 වශයෙන් සළකුණු කොට පෙන්නුම් කරන, වපසරියේ පර්චස් නවයයි දශම තුනයි බින්දුවක් (අ. 0, රූ. 0, පර්. 9.30) හෝ (හෙක්ටෙයාර් 0.023523) වූ බෙදා වෙන් කළ හා නිරූපිත ඉඩම් කැබැල්ලට මායිම් උතුරට: පල්ලෙහාවලව්වේවත්තේ වැටිය, නැගෙනහිරට : අංක 2817 පිඹුරේ කැබලි අංක 3, දකුණට : අංක 2817 පිඹුරේ කැබලි අංක 3, සහ අංක 2817 පිඹුරේ කැබලි අංක 2 ද, බටහිරට : ගොඩදෙපැල කුඹුර ද යන මායිම් තුළ භූමිය සහ ඒ මත පිහිටි ගොඩනැගිලි, ගහකොළ පළතුරු ආදී සියළු දේත් වන අතර, මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක බී 441/53 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සහකාර සාමාන්‍යාධිකාරී,
මධ්‍යම කලාපය.

මහජන බැංකුව,
මධ්‍යම කලාප කාර්යාලය,
අංක 17, දළදා වීදිය,
මහනුවර.

10-397

---

### මහජන බැංකුව - ආයතනික II අයකිරීම්

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2006.09.22 වැනි දින පැවැත් වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒකනායක විසින් සහතික කරන ලද 2003.10.17 දිනැති අංක 4202 දරන උකස් බැඳුම්කරය මත මහජන බැංකුවට ගෙවීම් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද "ප්‍රීලැන්ඩ් හවුස් ප්‍රයිවට් ලිමිටඩ්" සමාගම විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ හැට ලක්ෂ අනූහතර දහස් එකසිය අනූතුනක (රු. 60,94,193) මුදලක් මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇත. එබැවින් 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් රුපියල් තිස් දෙලක්ෂ තිස් හත්දහස් දෙසිය තිස් නවයක (රු. 3,237,239) මුදලට 2001.07.01 දින සිට වර්ෂයකට සියයට විසිහතර (24%) බැගින් සහ රුපියල් විසිඅටලක්ෂ පනස්හය දහස් නවසිය පනස් හතරක (රු. 28,56,954) මුදලට 2001.09.15 දින සිට වර්ෂයකට සියයට විසිහතර බැගින් (24%) වෙන්දේසි දිනය තෙක් පොළිය ද වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අනුව එකී රුපියල් හැටලක්ෂ අනූහතර දහස් එකසිය අනූතුනක (රු. 6,094,193) මුදල අයකර ගැනීම සඳහා එකී අංක 4202 දරන උකස්කරය මගින් එකී බැංකුවට උකස්කර ඇති දේපල හා පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියක දී විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගරසීමාව තුළ දෙමටගොඩ පාරේ පිහිටි 1950.09.04 දිනැති අංක 1027 දරන මූලික පිඹුරේ සඳහන් දැනට වරිපනම් අංක 382 (වත්ත) දරන ලොට් බී හි දක්වා ඇති වත්තේ උපකොටසක් වූද, ඉඩම් කොටස් වන වී කාර්තිගේසු බලයලත් මිනින්දෝරු තැන සකස් කරන ලද අංක 1116ඒ දරන පිඹුරේ සඳහන් ලොට් 6ට මායිම් උතුරට-නැගෙනහිරට : ලොට් අංක 07 ද, (පාරක් සඳහා වෙන් කරන ලද අඩි 20 කොටසකි) දකුණට-නැගෙනහිරට : වරිපනම් අංක 25 දරන පරිශ්‍රය, කැටවලමුල්ල ප්‍රවේශ මාර්ගය වඩා නිවැරදිව නගර සභා කාණුව ද, දකුණට-බටහිරට : දෙමටගොඩ පාර දැනට වරිපනම් අංක 364/11 දරන පරිශ්‍රය ද සහ උතුරට-බටහිරට : ලොට් 5 ද යන මායිම් තුළ පිහිටි පළල්වන මාර්ගය සඳහා වෙන් කරන ලද පර්චස් 5.90 හැර. පර්චස් තිස් නවයයි දශම හතයි දෙකක විශාල ඉඩම (අ. 0, රූ. 0, ප. 39.72) සහ එහි පිහිටි ගොඩනැගිලි ගහකොළ වැවිලි සහ සියළු දේ ද වේ. මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 950/132 ඒ-950/132 හි ලියාපදිංචි කර ඇත.

කොළඹ දිස්ත්‍රික්කයේ මහ නගර සභා සීමාව තුළ දෙමටගොඩ පාරේ පිහිටා ඇති අංක 1027 දරන ඉහතකී මූලික පිඹුරේ සඳහන් දැනට 382(වත්ත) වරිපනම් අංකය දරන ලොට් B වශයෙන් සඳහන් සම්පූර්ණ ඉඩමේ උපකොටසක් වූද ලොට් 7 වශයෙන් සඳහන් ඉඩම් කොටසට ඉහත කී පිඹුර ප්‍රකාර මායිම් උතුරට-නැගෙනහිරට : වරිපනම් 392 සහ 396 1/5 දරන පරිශ්‍රය ද, දකුණට-නැගෙනහිරට : වරිපනම් අංක 25 දරන පරිශ්‍රය, කැටවලමුල්ල ප්‍රවේශ මාර්ගය වඩා නිවැරදිව මහ නගර සභා කාණුව ද, දකුණට-බටහිර : දෙමටගොඩ පාරේ අංක 364/11 දරන පරිශ්‍රය සහ උතුරට-බටහිරට : දෙමටගොඩ පාරද යන මායිම් තුළ පිහිටි පර්චස් තිස්හතයි දශම දෙකයි බිංදුවක් (අ. 0, රූ. 0, ප. 37.20) විශාල ඉඩම සහ වාහනවලින් හෝ වාහන හෝ කරත්ත නොමැතිව ගමන් කිරීම සහ ජලනල, ජලප්‍රවාහන නල එළීම විදුලි රැහැන් ඇදීම සහ සියලුම නිත්‍යානුකූල කාර්යයන් සඳහා මාර්ගය භාවිතා කිරීමේ අයිතිය ද සමඟ වේ.

මෙම ඉඩම කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 725/247හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රධාන කළමණාකරු,
ආයතනික II (අයකිරීම්).

මහජන බැංකුව,
ආයතනික II (අයකිරීම්),
10 වන මහල
ප්‍රධාන කාර්යාලය
කොළඹ 02.

10-396

## මහජන බැංකුව - ආයතනික බැංකු අංශය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පහත සඳහන් යෝජනාව 2006 ඔක්තෝබර් 20 දින පැවති රැස්වීමේදී ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ වාසියට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒකනායක මිය විසින් සහතික කරන ලද අංක 4250 සහ 2003 දෙසැම්බර් 05 දින දරන උකස් බැඳුම්කරය මත ගෙවීම් හිමිකාරත්ව ගිශාන් පෝල්ට්‍රි ෆාම් ව්‍යාපාරය පැහැර හැර ඇති බැවින්, එකී බැඳුම්කරය මත රුපියල් විසිහත් ලක්ෂ හැට හතර දහස් එකසිය අනූ නවයයි ශත හතලිස් නවයක් (රු. 2,764,199.49) වන මුදල ඒ සඳහා පොලියද සමග මහජන බැංකුවට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇත.

රුපියල් විසිහත් ලක්ෂ හැට හතර දහස් එකසිය අනූ නවයයි ශත හතලිස් නවයක් (රු. 2,764.199.49)ක් වන එකී මුදල සහ රුපියල් විසිහත් ලක්ෂ හැට හතර දහස් එකසිය අනූ නවයයි ශත හතලිස් නවයක් (රු. 2,764,199.49) වන මුදල මත 2003.09.01 දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට දහඅට (18%) ක අනුප්‍රමාණයට තවදුරටත් පොලිය ද, විකුණුම් වියදම් පිරිවැය හා එකී මහජන බැංකු පනතේ 29එල් වගන්තිය යටතේ අයකරගත හැකි මුදල්, එදිනතෙක් ලැබී ඇති ගෙවීම් (කිසිවක් වේනම්) අඩු කිරීමෙන් පසුව අයකර ගැනීම සඳහා අංක 4250 දරන එකී උකස් බැදුම්කරය මගින් එකී බැංකුවට උකස්කරන ලද දේපල කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන ෂොක්මන් ඇන්ඩ් සමරවික්‍රම මහතුන් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ ඔවුන් වෙත පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### උකස් කරන ලද දේපල පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ දකුණ කටුගම්පලහත්පත්තුවේ, කටුගම්පල කෝරලේ, බුත්තැහෙපොල නමැති ගමේ පිහිටි ඉහළපිටිය සහ කටුගම්පල වත්ත නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ජේ. එල්. වීරවර්ධන විසින් සාදන ලද අංක 3646 සහ 1987.03.19 දින දරන පිඹුරේ ලොට් 6 වශයෙන් පෙන්නුම්කර ඇති බෙදා වෙන් කරන ලද සම්පූර්ණ ඉඩම් කට්ටිය වන එකී ලොට් 6ට මායිම් උතුරට : ඉහත කී අංක 3646 දරන පිඹුරේ ලොට් 5 ද, නැගෙනහිරට : ටී. ආර්. ප්‍රනාන්දුගේ ඉඩම ද, දකුණට : ඉහත කී අංක 3646 දරන පිඹුරේ ලොට් 7 සහ බස්නාහිරට : ඉහත කී අංක 3646 දරන පිඹුරේ ලොට් 2 සහ ලොට් 8 (අඩි 12ක් පළල පාරක් සඳහා වෙන්කළ කොටස) ද මායිම් වූ අක්කර දෙකක් (අ. 2, රූ. 0, පර්. 0) විශාලත්වයක් ඇති ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වගාවන් සහ සෑම. සියළුදේත් වේ. මෙය කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කෝ123/174හි ලියාපදිංචි කර ඇත.

තවද, ඉහත කී අංක 3646 දරන පිඹුරේ ලොට් 8 වශයෙන් දක්වා ඇති මාර්ග රක්ෂිතය දිගේ හා මත පාවිච්චි කිරීමේ අයිතිය සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජොෂ්ඨ කළමණාකරු,
ආයතනික බැර - 2.

මහජන බැංකුව,
ආයතනික බැංකු අංශය,
35, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

10-394

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 04/0/44/00144.

ණයකරුගේ සම්පූර්ණ නම : ලියනරාළේගෙදර ලයනල් ප්‍රේමසිරි සහ රත්හොට් ගෙදර මල්ලිකා.

මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එස්. රාජමුණි විසින් ලියා සහතික කරන ලද අංක 2252 හා 1996.04.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ දහදහස් නවසිය හැට එකයි ශත අසූ පහක (රු. 2,10,961.85) ක මුදලක් වර්ෂ 2003.09.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැට තුන්දහස් එකසිය හතලිස් නවයයි ශත හැත්තෑ අටක (රු. 1,63,149.78) ද වර්ෂ 2003.09.30 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් හත්දහස් අටසිය දොළහයි ශත හත (රු. 47,812.07) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ දහදහස් නවසිය හැට එකයි ශත අසූ පහක (රු. 2,10,961.85) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැට තුන්දහස් එකසිය හතලිස් නවයයි ශත හැත්තෑ අටක (රු. 1,63,149.78) මුදල මත අයවිය යුතු වර්ෂයකට 16.50% බැගින් වන පොළියක් 2003.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2003ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩුගම්පහ කෝරළේ, කුන්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ, අතරගල්ල පිහිටි නෙල්ලිගහකඩුල්ල වත්ත *හෙවත්* තැන්නපිටිය එස්ටේට් *හෙවත්* තැන්නපිටිය වත්ත නමැති ඉඩම 1995.07.23 දින එන්. බී. ඩී. වැත්තැව මානක තැන විසින් මැන සම්පාදිත අංක

1802 පිඹුර ප්‍රකාර කැබලි 1ට මායිම්, උතුරට : පැලඉනි වැට ද, නැගෙනහිරට : පාර ද, දකුණට : පැලඉනි වැට ද, බස්නාහිරට : පැලඉනි වැට සහ ප්‍රධාන පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි පර්චස් තිස් අටක (අ. 0, රූ. 2, පර්. 38) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමහ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 631/33හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

10-436

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0135500079.

ණයකරුගේ සම්පූර්ණ නම : දිසානායක මුදියන්සේලාගේ කීර්ති කුමාර දිසානායක.

කොට්ටාව ප්‍රසිද්ධ නොතාරිස් බී. ලියනගේ විසින් ලියා සහතික කරන ලද අංක 443 හා 2003.07.17 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස් හතරදහස් එකසිය අසූපහයි ශත අසූදෙකක (රු. 2,44,185.82) ක මුදලක් වර්ෂ 2007.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ අසූහතරදහස් අටසිය හැටතුනයි ශත විසිහතරක (රු. 1,84,863.24) මුදල ද, වර්ෂ 2007.02.28 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් පනස්නවදහස් තුන්සිය විසිදෙකයි ශත පනස්අටක් (රු. 59,322.58) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස් හතරදහස් එකසිය අසූපහයි ශත අසූදෙකක (රු. 2,44,185.82) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ අසූහතරදහස් අටසිය හැටතුනයි ශත විසිහතරක (රු. 1,84,863.24) මුදල මත අයවිය යුතු වර්ෂයකට 10.50% බැගින් වන පොලියක් 2007.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 10 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, මැද පත්තුවේ, සීතාවක ප්‍රාදේශීය සභා සීමාවේ, පින්නවල ග්‍රාමයෙහි පිහිටි මොරකැලේ වත්ත සහ සිරිසේන කොට්ඨාසය නැමැති ඉඩමට 1992.05.25 දින එස්. වික්‍රමසිංහ මානක තැන විසින් මැන සම්පාදිත අංක 2041 පිඹුර ප්‍රකාර ලොට් 07 මායිම්, උතුරට : ලොට් 08 ද, නැගෙනහිරට : ලොට් 12 ද, දකුණට : ලොට් 06 ද, බස්නාහිරට : පිඹුරු අංක 1327හි දැක්වෙන ලොට් 3ඩී ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහක (අ. 0, රූ. 0, පර්. 12) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග අවිස්සාවේල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ N 272/39හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරි.

10-437

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 2400000914.

ණයකරුගේ සම්පූර්ණ නම : කිරිදොන්තලාගේ රූපසේන.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ඩබ්. කීගල් විසින් ලියා සහතික කරන ලද අංක 2654 හා 2001.08.01 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් දෙසීය හැත්තෑහතරයි ශත තිස්දෙකක (රු. 2,52,274.32) ක මුදලක් වර්ෂ 2007.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ තිස්අටදහස් හයසිය හැටහයයි ශත අනූවක (රු. 1,38,666.90) මුදල ද, වර්ෂ 2007.02.28 වන දින දක්වා පොලිය

වශයෙන් රුපියල් එක්ලක්ෂ දහතුන්දහස් හයසිය හතයි ශත හතලිස් දෙකක් (රු. 1,13,607.42) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ පනස් දෙදහස් දෙසිය හැත්තෑහතරයි ශත තිස්දෙකක (රු. 2,52,274.32) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ තිස්අටදහස් හයසිය හැටහයයි ශත අනූවක (රු. 1,38,666.90) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13.90% බැගින් වන පොළියක් 2007.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්ලිව්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 10 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, නවදුන් කෝරළේ, මැදපත්තුවේ, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුද්දුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ මුද්දුව ග්‍රාමයෙහි පිහිටි දියගල්හේන නැමැති ඉඩමට 2001.05.04 දින එම්. සමරසේකර මානක තැන විසින් මැන සම්පාදිත අංක 6601 පිඹුර ප්‍රකාර ලොට් 1ට මායිම්, උතුරට : ලොට් 47 සහ 45 ද, නැගෙනහිරට : හක්ගමුව ගම් සීමාව ද, දකුණට : හක්ගමුව ගම් සීමාව සහ ප්‍රවේශ මාර්ගය ද, බස්නාහිරට : වතු පාර ද යන මායිම් තුළ පිහිටි රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 0) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉසං 1/5765හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-438

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0400001122.

ණයකරුගේ සම්පූර්ණ නම : මහර මුදියන්සේලාගේ ජයන්ත කුමාර මහර.

මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් ඒ. පී. සී. විමලසේන විසින් ලියා සහතික කරන ලද අංක 3735 හා 1999.05.31 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පහයි ශත තිස්පහක (රු. 2,45,005.35) ක මුදලක් වර්ෂ 2005.10.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ දාහතරදහස් තුන්සිය හැත්තෑහයයි ශත හැටඑකක (රු. 2,14,376.61) මුදල ද, වර්ෂ 2005.10.31 වන දින දක්වා පොළිය වශයෙන් රුපියල් තිස්දහස් හයසිය විසිඅටයි ශත හැත්තෑහතරක් (රු. 30,628.74) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පහයි ශත තිස්පහක (රු. 2,45,005.35) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ දාහතරදහස් තුන්සිය හැත්තෑහයයි ශත හැටඑකක (රු. 2,14,376.61) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50% බැගින් වන පොළියක් 2005.11.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. බඩ්. ජයසූරිය යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2006ක් වූ ජනවාරි මස 24 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### දේපළ පිළිබඳ විස්තරය

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ උතුරු පල්ලේසිය පත්තුවේ, රත්තොට ප්‍රාදේශීය සභා සීමාවේ, පල්ලේගම ග්‍රාමයෙහි පිහිටි මුල්පාගාන, කොස්ගහමුල වත්ත නමැති ඉඩමට 1998.05.15 දින යූ. එච්. බී. කේ. එම්. ටී. අංගම්මන මානක තැන විසින් මැන සම්පාදිත අංක 147 පිඹුර ප්‍රකාර ත්‍රිකෝණාකාර ඉඩමේ, ලොට් 1ට මායිම්, උතුරට : ඩී. ආර්. හේවාවසම්ට අයත් ඉඩම ද, දකුණට : රත්තොට අලකොළමඩ ප්‍රධාන පාරේ සිට කඹරගල දක්වා වූ පාර ද, බස්නාහිරට : ඩබ්. කේ. චන්ද්‍රසේන සිල්වාට අයත් ඉඩම වෙන්කරන ලද පැළඉනි වැට ද, යන මායිම් තුළ පිහිටි රූඩ් දෙකයි, පර්චස් දාසයක (අ. 0, රූ. 2, පර්. 16) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේ ද, මාර්ග පරවශතාවය ද සමග මාතලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 211/187හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-439

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001731.

ණයකරුගේ සම්පූර්ණ නම : දොඩන්ගොඩ හේවගේ ඥාණා පද්මිණී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ආර්. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 841 හා 2005.12.19 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් හාරලක්ෂ අටදහස් නවයයි ශත හැත්තෑ තුනක (රු. 4,08,009.73) මුදලක් වර්ෂ 2007.02.28 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්–

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් හයසිය හැටඅටයි ශත පනස් තුනක (රු. 3,62,668.53) මුදල ද වර්ෂ 2007.02.28 වන දින දක්වා පොලිය වශයෙන් රුපියල් හතලිස් පන්දහස් තුන්සිය හතලිස් එකයි ශත විස්සක් (රු. 45,341.20) ක් ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් හාරලක්ෂ අටදහස් නවයයි ශත හැත්තෑ තුනක් (රු. 4,08,009.73) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ හැටදෙදහස් හයසිය හැටඅටයි ශත පනස් තුනක (රු. 3,62,668.53) මුදල මත අයවිය යුතු වර්ෂයකට 13% බැගින් වන පොළියක් 2007.03.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා ද,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වන වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තා වූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකරු ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 10 වැනි දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කරන ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දූනගහපත්තුවේ, අළුත්කුරු කෝරළේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාවේ (දිවුලපිටිය උප කාර්යාලය) කඩවල ග්‍රාමයෙහි පිහිටි කුඩුමිරිස්ස සහ පින්නලන්ද නමැති ඉඩමට 1999.01.11 දින ආර්. ඒ. චන්ද්‍රරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 7422 පිඹුර ප්‍රකාර ලොට් 71ට මායිම්, උතුරට : ලොට් 73 ද, නැගෙනහිරට : ලොට් 70 ද, දකුණට : ලොට් 14(අඩි 30 පළල පාර) ද, බස්නාහිරට : ලොට් 72 ද යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවක් (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමඟ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 830/143 හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදිය.

සාමාන්‍යාධිකාරී.

10-440

---

## මහජන බැංකුව - කැළණිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2002.05.10 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 1999.12.02 දිනැති අංක 4562 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම්, රත්නායක මුදලිගේ නන්දසේන රත්නායක යන අය විසින් පැහැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් හාරලක්ෂය (රු. 4,00,000) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2001.12.13 දින සිට වර්ෂයකට 24% බැගින් රුපියල් හාරලක්ෂය (රු. 4,00,000)ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් හාරලක්ෂය (රු. 4,00,000) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 4562 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ යටතේ තමත් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, මැද පත්තුවේ, ගම්පහ අලුත්ගම පිහිටි කපුහේන එස්ටේට් නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ජී. රණසිංහ විසින් 1999.01.26 වැනි දින මැන සාදන ලද අංක 5/99 දරන පිඹුරේ ලොට් අංක 1බී4ඒ දරන කොටසට මායිම් උතුරු-නැගෙනහිරට : ලොට් 1බී4 ද, දකුණු-නැගෙනහිරට : පිඹුරු අංක 8530හි ලොට් 2 ද, දකුණු-බස්නාහිරට : පිඹුරු අංක 16/98හි ලොට් 1බී3 ද, උතුරු-බස්නාහිරට : පාර සහ පිඹුරු අංක 18 ඒ/88හි ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි පර්චස් හතයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 7.5) ක විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 588/15හි ලියාපදිංචි කර ඇත.

2. ඉහත කී මැදපත්තුවේ ගම්පහ අලුත්ගම පිහිටි කපුහේන එස්ටේට් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. පී. රණසිංහ විසින් 1998.05.27 වැනි දින මැන සාදන ලද අංක 16/98 දරන පිඹුරේ ලොට් අංක 1බී3 දරන කොටසට මායිම්, උතුරු-නැගෙනහිරට : ලොට් 1බී කොටසේ ඉතිරි කොටස ද,

නැගෙනහිරට : එච්. ඩබ්. ද සේරම්ට අයත් පිඹුරු අංක 8530හි ලොට් 2 ද, දකුණු-බස්නාහිරට : පී. චන්ද්‍රදාසට අයත් පිඹුරු අංක 25/93හි ලොට් 1බී2 ද, උතුරු-බස්නාහිරට : පාර සහ වෙන් කරන ලද පාර ද (මීටර් 6.1ක් හෝ අඩි 20ක් පළල පාර) (පිඹුරු අංක 18 ඒ/88හි ලොට් 01ඩී) ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම පහ (අ. 0, රූ. 0, පර්. 12.5) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැව්ලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඊ 537/130හි ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර, බැලුම්මහර,
මුදුන්ගොඩ.

10-395

---

## සීමාසහිත හැටන් නැෂනල් බැංකුව-මස්කෙළිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය දරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2007.08.30 වැනි දින පවත්වන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේදී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

හැටන් ප්‍රසිද්ධ නොතාරිස් ආර්. සී. කරුණාකරන් විසින් සහතික කරන ලද්දාවූ ද සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ නමට ලියන ලද්දාවූ ද 1998.03.28 වැනි දින සහ අංක 1966 දරන බැඳුම්කරය යටතේ උකස්කොට අත්තාවූ එහි උපලේඛනයේ අංක 01 හා 02 යටතේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ දේපළ හා පරිශ්‍රයන් දෙකෙන් අංක 01 යටතේ විස්තර කරන ලද දේපළ ඉහත අංක 1966 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදලින් කොටසක් ගෙවා නිම කිරීම නිසා සහ ගෙවීමට ඇති ඉතිරි මුදල සඳහා අංක 2 යටතේ විස්තර කරන දේපළ ප්‍රමාණවත් සුරක්ෂිතයක් ලෙසට බැංකුව සෑහීමකට පත්වූ නිසාත් කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එල්. ඒ. ඩී. ගුණතිලක විසින් සහතික කරන ලද්දාවූ 2004.01.23 වැනි දිනැති අංක 967 දරන ඔප්පුව මගින් ඉහත කී උපලේඛනයේ අංක 1 යටතේ විස්තර කරන ලද දේපළ නිදහස් කරන ලද අතර, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති සහ 1966 දරන බැඳුම්කරයේ උපලේඛණයේ අංක 02 යටතේ විස්තර කර ඇති දේපළ සඳහා අයවිය යුතු මුදල් ගෙවීම මුරුගේසු ගුරුචන්ද්‍රන් ණයකරු හැටියට සහ පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් එක්ලක්ෂ හැත්තෑඑක්දහස් නමසිය හතලිස්නමය (රු. 1,71,949)ක මුදලක් 2006.12.31 වැනි දින වන විට සීමාසහිත හැටන් නැෂනල් බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 1,71,949ක මුදලට 2007.01.01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොලිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු සහ මුදල් ප්‍රමාණයන්ද තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේනම් ඒ මුදල අඩුකොට එකී අංක 1966 දරන උකස් බැඳුම්කර මගින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව වෙත උකස් කොට ඇත්තා වූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ සීමාසහිත හැටන් නැෂනල් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, දැන් මහනුවර දිස්ත්‍රික්කයේ, උඩ බුලත්ගම කෝට්ඨාසයේ, අඹගමුව කෝරළේ, අප්කොට් හි පිහිටි අප්කොට් බසාර් හි කොටසක් නමින් හඳුන්වනු ලබන ඉඩමට බලයලත් මානක ඩී. එල්. ඩී. වයි. විජේවර්ධන විසින් සාදන ලද 1988.11.16 දින හා අංක 4022 දරන පිඹුරේ බෙදා වෙන් කරන ලද ලොට් අංක 02 දරන ඉඩම් කොටසින් උතුරට : ලොට් අංක 1න් ද, නැගෙනහිරට : ලොට් අංක 1 සහ 4න් ද, දකුණට : ලොට් අංක 4 සහ පාර (අධිවේගී මාර්ගයෙන්) ද, බටහිරට : ලොට් අංක 1 සහ පාර (අධිවේගී මාර්ගයෙන්) ද මායිම් වූ පර්චස් එකයි දශම දෙකයි දෙක (අ. 0, රූ. 0, පර්. 1.22) විශාලැති ඉඩම ගම්පොල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී දරන කොට්ඨාසයේ 30 වෙළුමේ 318 දරන පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්.

10-446

---